954.8
DHE

# පුරාතන ශ්‍රී ලංකාවේ රාජ්‍යයේ ප්‍රභවය හා වර්ධනය:

UNIVERSITY OF PERADENIYA
FACULTY OF ARTS
27 OCT 1997
SENIOR ASST. REGISTRAR

බෞද්ධ අභාසය කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් ක්‍රි. පූ. තෙවැනි ශතවර්ෂයේ සිට ක්‍රි. ව. තෙවැනි ශතවර්ෂය දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන සංවිධානයේ විකාශය පිළිබඳව කෙරෙණ ඓතිහාසික අධ්‍යයනයක්

හඟුරන්කෙත ධීරානන්ද

ශාස්ත්‍රපති උපාධිය සඳහා
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
වෙත
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය
1997

594959

# සාරාංශය

පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන සංවිධානයේ ප්‍රභවය හා එහි වර්ධනය ගැනත් ඒ කෙරෙහි බලපෑ සාධක පිළිබඳවත් අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එමෙන්ම පාලන සංවිධානය හා බුද්ධාගම අතර පැවති සම්බන්ධතා හා එමගින් පාලන සංවිධානයේ හැඩගැසීම කෙරෙහි ලැබුණු දායකත්වය කවරේද යන්න පිළිබඳවත් විමර්ශනය කිරීමට ද බලාපොරොත්තු වේ. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කෙරෙහි වැඩි විශ්වසනීයත්වයකින් හා සාහිත්‍ය මූලාශ්‍ර උචිත පරිදි යොදා ගනිමින් කරනු ලැබ ඇති මෙම පර්යේෂණය ක්‍රි. පූ. තෙවන සියවසේ සිට ක්‍රි. ව. තෙවැනි සියවස දක්වා වූ සියවස් හයකට සීමා කර තිබේ.

අධ්‍යයනයට ප්‍රවේශයක් ලෙසින් මෙහි පළමු පරිච්ඡේදය රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳව දැනට ඉදිරිපත්වී ඇති මතවාද විමසීමට වෙන් කර තිබේ. ලංකාවේ රාජ්‍යය හා රාජ්‍යත්වයේ ප්‍රභවය පිළිබඳව මෙතෙක් ඉදිරිපත් වී තිබෙන අදහස් පිළිබඳ සාකච්ඡා කිරීම දෙවන පරිච්ඡේදයෙන් සිදු කර ඇත.

තෙවැනි හා සිවුවැනි පරිච්ඡේදවලින් ලංකාවේ දේශපාලන සංවිධාන බිහිවීම හා ඒවායෙහි වර්ධනයට බලපෑ සාධක කවරේද? යන්න පිළිබඳ විමර්ශනයක් කෙරෙන අතර. මේ යටතේ පුරාණ ලංකාවේ දේශපාලන සංවිධානය දේශීයව ඇතිවූවක්ය යන ප්‍රශ්නය සාකච්ඡා කෙරේ මේ සඳහා බලපෑ දේශීය හා විදේශීය සාධක රැසක් හඳුනා ගනිමින් ඒ පිළිබඳ විමසුමක් ද කර ඇත.

රාජ්‍යය සංවිධානයේ ව්‍යුහය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව අධ්‍යයනයක් පස්වැනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

සවැනි පරිච්ඡේදයෙන් රාජ්‍යය හා ආගම අතර පැවති සම්බන්ධතා කවරේද යන්න හඳුනා ගැනීමට බලාපොරොත්තු වන අතර පාලන නායකත්වය හා පාලන සංවිධානයේ හැඩ ගැසීම කෙරෙහි බලපෑ බෞද්ධ සංකල්ප කවරේද? යන්නත් මෙහිදී සාකච්ඡා කරනු ලැබේ.

පාලකයා හා භික්ෂුව අතර පැවති සම්බන්ධතා හඳුනා ගැනීමට සත්වැනි පරිච්ඡේදය වෙන් කෙරේ. රජ සහ භික්ෂුව අතර පැවැති සම්බන්ධතා රාජ්‍යයේ පැවැත්මට හා වර්ධනයට කෙසේ බලපා තිබේද? යන්න පිළිබඳ මේ යටතේ විමසුමට ලක්කර ඇත.

මෙසේ පරිච්ඡේද හතක් යටතේ ගොණු කොට ඇති කරුණු අනුසාරයෙන් පුරාණ ලංකාවේ රාජ්‍යය සංවිධානය දේශීයව ඇති වූවක් ලෙසින් සනාථ කරලීමටත් එහි වර්ධනය කෙරෙහි විශේෂ දායකත්වයක් බෞද්ධාගම තුළින් ලබා දුන් බව පෙන්වාදීමට මෙයින් අපේක්ෂිතය.